සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024
Third Term Test - Grade 13 - 2024

# බෞද්ධ ශිෂ්ටාචාරය - I

කාලය පැය 02 යි

නම/ විභාග අංකය:

**උපදෙස්**

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට 1,2,3,4,5. යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එය සලකුණු කරන්න

01. එක් එක් වර්ණයන්ට අදාළ ස්ව ධර්මයන් හෙවත් කාර්යයක් අතරින් ක්ෂත්‍රිය වර්ණයට පමණක් අනන්‍ය වූ කාර්යක් වන්නේ,
(1) ඉගෙනීම (2) දන්දීම (3) යාගකිරීම (4) පශුපාලනය. (5) කාමයෙහි නොඇලීම.

02. පහත දැක්වෙනුයේ ආශ්‍රම ධර්මවලට අදාළ ක්‍රියාකාරකම් කිහිපයකි.
A යෝගී ජීවිතයක් ගත කිරීම
B අනගාරික හුදකලා සංචාරක ජීවිතයක් ගතකිරීම
C බ්‍රහ්ම සහව්‍යතාව අපේක්ෂාවෙන් කල්ගත කිරීම
D සියලු කාමයන්ගෙන් බැහැර ව ක්‍රියා කිරීම
E පඤ්චවිධ යාගයන් සිදුකිරීම අනිවාර්ය අංගයක් විය
මෙම ක්‍රියාකාරකම් අතරින් සන්‍යාසී ආශ්‍රමයට අයත් ක්‍රියාකාරකම් දක්නට ලැබෙනුයේ,
(1) Aවල පමණි (2) A සහ Bවල පමණි (3) A, B සහ Cවල පමණි
(4) A,B, C සහ D වල පමණි (5) A, B,C,D සහ E යන සියල්ලෙහි ය.

03. බුදුරජාණන් වහන්සේ මහා ප්‍රජාපතීගෝතමියගේ ඉල්ලීම අනුව .......................... දී භික්ෂුණී ශාසනය පිහිට වූ බව චුල්ලවග්ග පාලියේ සඳහන් වේ.
(1) රජගහනුවර වේළුවනාරාමයේ දී (2) සැවැත්නුවර ජේතවනාරාමයේ දී
(3) කොසැඹෑනුවර ඝෝෂිතාරාමයේ දී (4) විශාලාමහනුවර කූටාගාර ශාලාවේ දී
(5) ශාක්‍ය ජනපදයේ නිග්‍රෝධාරාමයේ දී

04. පහත දැක්වෙනුයේ පොදුවේ ශ්‍රමණ සම්ප්‍රදායට අදාළ ලක්ෂණයන්ගෙන් කිහිපයකි.
A අනගාරික ප්‍රතිපදාව පිළිගැනීම
B පුද්ගල ස්වාමිත්වය අගය කිරීම
C අභ්‍යන්තර හා බාහිර පාරිශුද්ධත්වයෙන් යුක්තවීම.
D ඊශ්වර නිර්මාණවාදය බැහැර කිරීම
E අටලෝ දහමින් කම්පා නොවීම
මෙම ලක්ෂණයන් අතරින් බෞද්ධ ශ්‍රමණ සම්ප්‍රදායට පමණක් අනන්‍ය වූ ලක්ෂණ දක්නට ලැබෙනුයේ,
(1) A,B, C වල පමණි (2) B,C,D වල පමණි (3) C,D,E වල පමණි
(4) B,C,E වල පමණි (5) A,C,E වල පමණි

05. "දානයෙන්, ඉන්ද්‍රිය දමනයෙන්, සංවරයෙන් සත්‍ය වචනයෙන් සිදුවන විපාකයක් නැතැයි" උගන්වනු ලැබුවේ .................................. ශාස්තෘවරයා විසිනි.
(1) පූරණ කස්සප (2) මක්ඛලි ගෝසාල (3) අජිත කේසකම්බලී
(4) පකුධ කච්චායන (5) සංජය බෙල්ලට්ඨිපුත්ත

06. පහත සඳහන් ප්‍රකාශ කියවා නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) මගධ, කෝසල, මත්ස, අවන්ති බුද්ධ කාලයේ පැවැති ප්‍රබල රාජාණ්ඩු වේ.
(2) පෞර රාජ්‍ය බිඳවැටීම මහා රාජ්‍ය බිහිවීමට හේතු විය.
(3) මුල් අවධියේ කෝසල රාජ්‍ය දුර්වල රාජ්‍යයක්ව පැවැතුණි.
(4) බුදුරදුන් අවසාන වස්කාලය ගත කළ බේලුව ග්‍රාමය ද මල්ල රාජ්‍යයට අයත් විය.
(5) ගණතන්ත්‍ර පාලනයන්හි බලය පරම්පරාවෙන් පරම්පරාවට හිමිවිය.

07. කෘෂි ආර්ථිකයට මුල් තැනක් දුන් පැරණි භාරතයේ ජාත්‍යන්තර වශයෙන් වාණිජකරණය දියුණු තත්වයකට පත්ව තිබුණ බවට දක්විය හැකි වඩාත් සුදුසු සාධකය වන්නේ,
(1) නව නගර නිර්මාණය වීමයි.
(2) සේද මාර්ගය ඔස්සේ සිදු වූ වෙළදාමයි.
(3) භාණ්ඩ නිෂ්පාදනය ඉහළ යාමයි.
(4) ගංගාවන් ඔස්සේ භාණ්ඩ ප්‍රවාහනය කිරීමයි.
(5) කෘෂි නිෂ්පාදනවලින් ස්වයං පෝෂණය වීමයි.

08 මල්ල රජදරුවන්ගේ අඹ වනයේ බුදුරජාණන් වහන්සේ වැඩසිටින අතර එහිදී .................................. පැවිද්ද සිදුවිය.
(1) ශාක්‍ය කුමාරවරුන්ගේ
(2) භද්‍රවග්ගීය කුමාරවරුන්ගේ
(3) මහා කච්චායන තෙරුන්ගේ
(4) ප්‍රජාපතී ගෝතමිය ඇතුළු කුමාරිකාවන්ගේ
(5) යසකුල පුත්‍රයා ඇතුළු යහළුවන්ගේ

09 සිවු සස් සිය තැණින් - දන දන්වී ය කුලුණින්
දුරලයි අනුවණින් ........................
යනාදී වශයෙන් දැක්වෙන මෙම පද්‍යයෙන් විස්තරවන බුදුගුණය කුමක් ද?
(1) භගවා ගුණ
(2) බුද්ධ ගුණය
(3) සුගත ගුණය
(4) විජ්ජාචරණ ගුණය
(5) ලෝකවිදූ ගුණය

10. බුදුරජාණන් වහන්සේගෙන් ප්‍රශ්න ඇසීමට විවිධ උගත්තු හා නා නා තරාතිරමෙ අය පැමිණියහ. ඔවුන් ඉදිරිපත් කළ ප්‍රශ්නවලට අනුකූලවන පරිදි සිව්වැදෑරුම් ක්‍රමයකට ප්‍රශ්න විසඳූ අයුරු ඇතැම් සූත්‍ර ධර්ම අධ්‍යයනය කිරීම තුලින් අනාවරණය වේ. චූල්ල කම්ම, සච්ච විභංග, වැනි සූත්‍ර ඇතුලත් වන්නේ එම සිව්වැදෑරුම් ක්‍රමයෙන් කුමන ක්‍රමයට ද?
(1) ඒකාංස ව්‍යාකරණීය ක්‍රමයට
(2) විභජ්ජ ව්‍යාකරණීය ක්‍රමයට
(3) අට්ඨුප්පත්තික ක්‍රමයට
(4) පුච්ඡාවසික ක්‍රමයට
(5) පටිපුච්ඡා ව්‍යාකරණීය ක්‍රමයට

11. මෙයින් සතර මහාපදේශවලට අයත් නොවන වරණය තෝරන්න.
(1) මෙම ධර්මය මම බුදුරදුන්ගෙන් ම අසා දැන ගන්නා ලද්දකි.
(2) මෙම ධර්මය මම රහතන් වහන්සේගෙන් අසා දැන ගන්නා ලද්දකි.
(3) මෙම ධර්මය මම මහා සංඝයා වහන්සේගෙන් අසා දැන ගන්නා ලද්දකි.
(4) මෙම ධර්මය මම බොහෝ භික්ෂූන් වහන්සේගෙන් අසා දැන ගන්නා ලද්දකි.
(5) මෙම ධර්මය මම ධර්මධර, විනයධර භික්ෂූන් වහන්සේගෙන් අසා දැන ගන්නා ලද්දකි.

12. පහත දක්වෙනුයේ බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව සමකාලීනව සිදු කළ ඇගයීමකි. "භවත් ගෞතමයන් වහන්සේ කුලවත්, ධනවත්, රූමත්, වෘද්ධ කාමාශා දුරු කළ විශාල පිරිසකගේ ආචාර්යවරයෙකි. එතුමන් දෙව් මිනිසුනට පවා දහම් දෙසන කොසොල් රජුගේ ගෞරවාදරයට පාත්‍ර වූ කෙනෙකි." මෙම ඇගයීම සිදුකරනු ලැබුවේ,
(1) ඕපසාද ගමේ සිටි චංකි බමුණා ය.
(2) කේසපුත්තයේ සිටි කාලාමවරු ය.
(3) කක්කරපත්ත ගමේ සිටි දීඝජාණු පුත්‍රයා ය.
(4) චම්පා නුවර සිටි සෝණදණ්ඩ බමුණා ය.
(5) සැවැත්නුවර සිටි අනේපිඬු සිටුතුමන් ය.

13. චිත්ත ගහපති උපාසකතුමාට ගැරහීම නිසා ...................... බුදුරජාණන් වහන්සේ ප්‍රථම වතාවට පටිසාරණීය කර්මය පනවන ලදී.
(1) කෝකාලික හිමියන්ට
(2) ඡන්න හිමියන්ට
(3) සුධම්ම හිමියන්ට
(4) සුදින්න හිමියන්ට
(5) උදායි හිමියන්ට

14. "තමා හැර වෙනත් පුද්ගලයෙකුට හෝ තමා පාලනය කරන වෙනත් අදෘශ්‍යමාන බලවේගයක් කෙරෙහි විශ්වාසය නොතබා තමාගේ ගැලවුම්කරුවා තමාමය" යි සිතා ක්‍රියාකිරීමෙන් අදහස් වන්නේ,
(1) පුද්ගල ස්වාධීනත්වයයි.
(2) පුද්ගල වගකීමයි.
(3) පුද්ගල විශ්වාසයයි.
(4) පුද්ගල ස්වාමිත්වයයි.
(5) පුද්ගල ස්වච්ඡන්දතාව

Scanned with CamScanner

15. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ දී චතුර් වර්ණය සමාජය විසින් ගොඩනගන ලද්දක් බව හේතුඵල දහමට යටත්ව විස්තර කර ඇත. එහිදී පව් බැහැර කළ පිරිස බ්‍රාහ්මණයින් ලෙස හැඳින්වුණු ඔවුහු ඣායක හා අජ්ඣායක වශයෙන් දෙකොටසකට බෙදුන බව විස්තර වේ. මෙහි සඳහන් ඣායක බ්‍රාහ්මණයින්ගේ ලක්ෂණයක් වන්නේ

(1) අලංකාරවත් වූ කුඩා කුටි ඉදිකරගෙන වාසය කිරීමයි.
(2) විවිධ කර්මාන්තවල යෙදෙමින් කටයුතු කිරීමයි.
(3) ත්‍රිවේදය පිළිබඳ ග්‍රන්ථකරනයෙහි නියෙලෙමින් කටයුතු කිරීමයි.
(4) විවිධ ආගමික සංස්කාරයන්හි නියෙලෙමින් කටයුතු කිරීමයි.
(5) වනගතව භාවනානුයෝගීව කටයුතු කිරීමයි.

16. සර්වකාලීන හා සර්වදේශීය වටිනාකමින් යුත් බෞද්ධ දේශපාලන මූල ධර්මයක් වශයෙන් සප්ත අපරිහානීය ධර්ම හඳුන්වාදිය හැකිය. මෙම දේශපාලන මූලධර්මය පිළිබඳ ව වාර්තාවනුයේ,

(1) කූටදන්ත සූත්‍රයේය. 2) චක්කවත්ති සීහනාද සූත්‍රයේය. (3) ජාතක පාළියේය.
(4) අග්ගඤ්ඤ සූත්‍රයේය. (5) මහාපරිනිබ්බාණ සූත්‍රයේය.

17 පිවිතුරුගම සුහද බෞද්ධ සංගමයේ සාමාජිකයෝ පුරුද්දක් ලෙස, නිරතුරුව ම ගමේ ප්‍රජා ශාලාවට රැස්වූහ. ගමේ සංවර්ධනය පිළිබඳ දිගුවේලාවක් සාකච්ඡා කරන ඔවුන් ඉතා සමගියෙන් විසිර යන්නේ, නැවත හමුවීමේ අපේක්ෂාවෙනි. ගමේ සිටින වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා පිළිගත් ඔවුහු ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේට විශේෂයෙන් ගරුබුහුමන් කළහ. මෙම මිතුරන්ගේ ක්‍රියාකාරකම් තුළින් පැහැදිලි වන්නේ,

(1) ඔවුහු සතර අගතියෙන් තොර පිරිසක් බවයි.
(2) ඔවුහු පංචශීල ප්‍රතිපදාව ආරක්ෂා කරන පිරිසක් බවයි.
(3) අපරිහානිය ධර්ම අනුව දිවිගෙවන පිරිසක් බවයි.
(4) ඔවුහු ලෝකපාලක ධර්ම අනුගමනය කරන පිරිසක් බවයි.
(5) ඔවුහු ආගමික සංහිඳියාව අගයන පිරිසක් බවයි.

18. **කරුණාදාස බොදු පරිසරයේ හැදුණු වැඩුණු තරුණයෙකි. ඔහු නිරන්තරයෙන් ම දෙමාපියන්ට හා වැඩිහිටියන් සලකයි. භික්ෂූන් වහන්සේලාට පුදසත්කාර කරයි. හැකි සෑම අවස්ථාවක දී ම දානාදී පුණ්‍යකර්මවලට සහභාගි වී පිං අනුමෝදන් වෙයි. නිතර දහම් අසමින් තම දහම් දැනුම පිරිසිදු කරගනී. තම වත්පිළිවෙත් නොපිරිහෙළා ඉටුකරන ඔහු සදාචාර සම්පන්න ව ත්‍යාගශීලී ව කටයුතු කිරීම කාගෙත් ප්‍රශංසාවට හේතු විය.** ධර්මසිරිගේ ක්‍රියා අතර දශපුණ්‍ය ක්‍රියාවලට සෘජුව ම ඇතුළත් නොවන සෙසු පුණ්‍ය ක්‍රියා ගණන කොපමණද?

(1). තුනකි (2). දෙකකි (3). හතරකි (4). එකකි (5). පහකි

19. පුද්ගල හා සමාජ සංවර්ධනයෙහි ලා හිරි ඔත්තප්ප නම් වූ සාරධර්මයට හිමිවන්නේ සුවිශේෂී වැදගත්කමකි. මෙහි හිරි යනු පවට ඇති ලජ්ජාවයි. ඔත්තප්ප යනු පවට ඇති බියයි. පාපයට බියවීමට හේතුවන කරුණු හතරක් දහමෙහි දැක්වේ. එම හතරට අයත් නොවන්නේ මින් කුමක්ද?

(1) කරන ලද පාපකාරී ක්‍රියා නිසා තමාට පසුතැවිලිවීමට සිදුවේය යන බිය.
(2) කරන ලද පාපකාරී ක්‍රියා නිසා අනුන්ගේ දෝෂාරෝපනයට ලක්වේය යන බිය.
(3) කරන ලද පාපකාරී ක්‍රියාවනට දඬුවම් ලැබේය යන බිය
(4) කරන ලද පාපකාරී ක්‍රියාවනට අපාගතසිදුවීමට සිදුවේය යන බිය.
(5) කරන ලද පාපකාරී ක්‍රියා නිසා අනුන්ට පසුතැවිලි වීමට සිදුවේය යන බිය.

20. අෂ්ටාංග උපෝසත සීලයේ තෙවන ශික්ෂාපදය .................................................................... යනුවෙන් දැක්වේ.

(1) අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාධියාමි
(2) විකාල භෝජනා වේරමණී සික්ඛාපදං සමාධියාමි
(3) අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛාපදං සමාධියාමි
(4) මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාධියාමි
(5) කාමේසුමිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාධියාමි

Scanned with CamScanner

21. ශ්‍රද්ධාව ආකාරවතී හා අමූලිකා වශයෙන් කොටස් දෙකකට බෙදෙන අතර මේ කොටස් දෙකට අනන්‍ය වූ ලක්ෂණ ද දක්නට ලැබේ. ඒ අනුව ආකාරවතී ශ්‍රද්ධාවෙන් යුක්ත පුද්ගලයෙකුගේ චරිත ලක්ෂණයකි.
(1) ආමිස පූජාවන් කෙරෙහි අසීමිත හැගීමෙන් ක්‍රියාකිරීම.
(2) නොපෙනෙන බලවේග කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම.
(3) සියල්ල කර්මානුරූපීව සිදුවන බව පිළිගැනීම.
(4) ආගම කෙරෙහි අසීමිත භක්තියෙන් ක්‍රියා කිරීම
(5) තෙරුවන් කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීම.

22 පහත දැක්වෙනුයේ බෞද්ධ ආචාර ධර්මවලට අයත් ප්‍රකාශන කිහිපයකි
A දැහැමි වූත් ශිෂ්ට සම්පන්න වූත් මානසික තෘප්තිය සන්තුට්ඨිතාව නම්වේ.
B බොහෝ සැප සම්පත් අපේක්ෂා නොකොට සරළ දිවිපෙවතක් ගතකිරීම අලපේච්ඡතාවයි.
C හිරි ඔත්තප්ප දෙක දේව ධර්ම වශයෙන් ද හැඳින්වේ.
D රිය සකට කඩ ඇණය මෙන් සමාජයේ යහපැවැත්මට සතර සංග්‍රහ වස්තු උපකාරීවේ.
E සීමාවකින් තොරව වැඩිය යුතු බැවින් සතර බ්‍රහ්ම විහරණ චතු අප්පමඤ්ඤා නමින් ද හැඳින්වේ.
මෙම ප්‍රකාශන අතරින් වඩාත් නිවැරදි අර්ථකතනයන් ඇතුලත්වන්නේ,
(1) Aවල පමණි (2) A සහ Bවල පමණි (3) A, B සහ Cවල පමණි
(4) A,B, C සහ Eවල පමණි (5) A, B,C,D සහ E යන සියල්ලෙහිය.

23. බුදු රජාණන් වහන්සේ පරිසර සංරක්ෂණයට අදාළ ව කරුණු රැසක් විනය ශික්ෂාවන් හා ශේඛියාවලින් ඉදිරිපත්කොට ඇත. ඒවායින් කිහිපයක් පහත සඳහන්වේ. එයට අදාළ නොවන ප්‍රකාශය කුමක් ද?
(1) ගස්වැල් සිඳීමමෙන් ම පැළවන බීජ සිඳීම භික්ෂූන්ට ආපත්තියකි.
(2) යටි සුළඟේ සෙනසුන් ගසා නොදැමිය යුතබව චුල්ලවග්ග පාළියෙහි සඳහන්වේ.
(3) වනාන්තර ගිනි තැබීම භික්ෂූන්ට තහනම් කර ඇත.
(4) ගිලන් භික්ෂුවක විසින් ජලයට මළමුත්‍රා හෙළීම නොකළ යුතුය.
(5) යම් භික්ෂුවක් පොළව කෙටීම හෝ වෙනත් කෙනෙකුලවා එසේ කිරීම පාචිත්‍යය ඇවතකි.

24. "මනරම් තුරුලතාවෝ සුපිපි මලින් පරිසරය සුවඳවත් කරයි. පරණ පත් සලා නව සුමුදු පතින් සැරසුණු තුරුලතාවෝ ඵලදැරීමට කල්බලා සිටිති. වීරයාණෙනි නික්මයාමට මේ ඉතා සුදුසු ම කාලයයි". පරිසරයේ පවත්නා සුන්දරත්වය මේ ආකාරයට වර්ණනාකරනු ලැබුවේ,
(1) සප්පක තෙරුන් විසිනි (2) වනවච්ඡ තෙරුන් විසිනි
(3) කාළුදායි තෙරුන් විසිනි (4) තාලපුට තෙරුන් විසිනි
(5) මහා කස්සප තෙරුන් විසිනි

25. පුද්ගලයෙකුගේ ආචාර ධර්ම සකස්විය යුත්තේ ඔහුගේ කායික හා මානසික අසහනයට හේතු නොවන ආකාරයෙන් මෙන් ම සමාජයට කිසියම් මෙහෙයක් වන අයුරිනි. බෞද්ධ ආචාර ධර්ම සියල්ල ම ඉදිරිපත් වී ඇත්තේ ඒ අරමුණිනි. මේ ආචාර ධර්මවලට ගැනෙන අප්පිච්ඡතා ගුණයෙන් අදහස් වන්නේ
(1) කාම සම්පත් අතහැර ගත කරන විරාගී චරණයයි.
(2) අසීමිත අපේක්ෂා හා බලාපොරොත්වලින් තොරව ඒවා අල්ප කරගෙන කටයුතු කිරීමයි .
(3) පහසුවෙන් පෝෂණය කළ හැකි බවයි.
(4) සියලු ආශාවන්ගෙන් වියුක්තව කටයුතු කිරීමයි.
(5) සරල සැහැල්ලු කටයුතු සහිතව ක්‍රියා කිරීමයි.

26. දිළිඳුකම කාමභෝගී ගිහියාට දුකක්බව උගන්වන බුදුසමය, ඒ සඳහා ධාර්මිකව ප්‍රමාණවත් ආර්ථික ශක්තියක් උදාකර ගැනීම ගෘහස්ථ ජීවිතයට අත්‍යවශ්‍ය සාධකයක් ලෙස ද අවධාරණය කරයි. මෙම ආර්ථික සමෘද්ධිය පැහැදිලි කිරීමට වඩාත් ම සුදුසු පාරිභාෂික යෙදුම වන්නේ ,
(1) අත්ථි සුඛය යි. (2) භෝග සුඛය යි. (3) අනණ සුඛය යි. (4) උට්ඨාන සම්පදාව යි.
(5) සමජීවිකතාව යි.

Scanned with CamScanner

27. ධන පරිහරණයේ දී නොකා නොබී මිය යන අජද්ධුමාරික ක්‍රමයත්, දිඹුල් ගසේ අතු සොලවා දිඹුල් කඩා කන්නෙකු මෙන් ක්‍රියා කරන උදුම්බර ඛාදික ක්‍රමයත් බුදුදහමින් ප්‍රතික්ෂේප කරයි. ඒ වෙනුවට ව්‍යග්ඝපජ්ජ සූත්‍රය තුළින් නිර්දේශිත ක්‍රියාවලිය වන්නේ,
(1) ආරක්ඛ සම්පදාවයි. (2) කල්‍යාණ මිත්තතාවයි. (3) සමජීවිකතාවයි.
(4) උට්ඨානසම්පදාවයි. (5) සද්ධා සම්පදාවයි.

28. බෞද්ධයාගේ ඒකායන නිර්වාණගාමී මාර්ගය වන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. එය වනාහි ලෝකෝත්තර අභිවෘද්ධිය සඳහා ක්‍රියාකරන භික්ෂුවටත් ලෞකික අභිවෘද්ධිය පතන ගිහියාටත් පොදුය. මෙම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ දැක්වෙන **සම්මා කම්මන්ත** යනුවෙන් අදහස් කෙරෙන්නේ,
(1) කායික වාචසික දුශ්චරිතවලින් වෙන්වීමය. (2) කායික සදාචාරවත් බව රැකගැනීමය.
(3) දිවිපැවැත්ම සඳහා කරන වැරදිවලින් වැළකීමය. (4) තිදොරින් කරන වැරදිවලින් වැළකීමය.
(5) සාවද්‍ය කර්මාන්තවලින් වැළකී යහපත් කර්මාන්තවලින් මුදල් ඉපයීමය.

29. සිගාලෝවාද සූත්‍රයේ සඳහන් භෝග විනාශ මුඛ හයට අදාළ ආදීනව තිස් හයක් දැක්වේ. එම තිස් හයෙන් "බලා සිටියදී ම ධනය විනාශවන බව" භෝග විනාශ මුඛ දෙකක ම දැක්වේ. එම භෝග විනාශ මුඛ දෙක ඇතුළත් වරණය කුමක් ද?
(1) මත් ද්‍රව්‍ය භාවිතයෙහි හා අවේලාවේ වීථි සංචාරයෙහිය.
(2) පාපමිත්‍ර සේවනයෙහි හා අලස කමෙහිය
(3) සූදුවෙහි හා සමජ්ජාභිචරණයෙහිය
(4) මත් ද්‍රව්‍ය භාවිතය හා සූදුවෙහිය
(5) අලසකමෙහි හා සමජ්ජාභිචරනයෙහිය.

30. සිගාලෝවාද සූත්‍රයේ ඇතුළත් පැවිදි උතුමන්ගෙන් ගිහියනට ඉටුවිය යුතු යුතුකම් අතරින් නොගැළපෙන යුතුකම ඇතුළත් වරණය කුමක් ද?
(1) පවින් වැලැක්වීම (2) යහපතෙහි යෙදවීම (3) යහපත් සිතින් අනුකම්පා කිරීම
(4) සුගතියට මග කියා දීම - (5) සමානාත්මතාව දැක්වීම

31. මංගල සූත්‍රයේ ඇතුළත් **ආරති විරති පාපා** යන්නෙහි අර්ථය කුමක් ද?
(1) පාපයෙහි නො ඇලීම හා පවින් වැළකීමයි (2) පෙර කළ පින් ඇති බවයි
(3) සුදුස්සාට ගරු කිරීම යටහත් පැවැතුම් ඇති බවයි (4) කළ ගුණ දන්නාබවයි
(5) පව් කිරීමට ලජ්ජාව හා බියයි

32. බුදුරජාණන්වහන්සේ ඡන්න තෙරුන්ගේ වැරදි හැසිරීම් හා නොමනා ප්‍රකාශයන් පදනම් කරගෙන තමන් වහන්සේගේ පරිනිර්වාණයෙන් අනතුරු ව ආනන්ද හිමියන් අමතා ඡන්න තෙරුන්ට බ්‍රහ්ම දණ්ඩනය නිර්දේශ කරමින් දේශනා කළ ධම්මපද ගාථාව වන්නේ,
(1) **"නිධීනංව පවත්තාරං - යං පස්සේ වජ්ජදස්සිනං ........"** යන ගාථාව ය.
(2) **"න භජෙ පාපකේ මිත්තේ - න භජෙ පුරිසාධමේ ........"** යන ගාථාව ය.
(3) **"සහස්සමපි චේ වාචා - අනත්ථපදසංහිතා ........"** යන ගාථාව ය.
(4) **"න පරේසං විලෝමානි - න පරේසං කතාකතං ........"** යන ගාථාව ය.
(5) **"මධුවා මඤ්ඤති බාලෝ - යාව පාපං න පච්චති ........"** යන ගාථාව ය

33. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වයෙන් අනතුරු ව ජටිල භික්ෂූන් සමග බිම්බිසාර මහරජතුමන් මුණ ගැසීමට ..............................පොහෝ දින වැඩම කරනු ලැබුවේ මගධ රාජ්‍යයේ ලට්ඨිවනයටය.
(1) බක්මස පුර අටවක (2) දුරුතු අව අටවක (3) දුරුතු පුර අටවක
(4) දුරුතු පුරපසළොස්වක (5) වෙසක් පුරපසළොස්වක

Scanned with CamScanner

34. ප්‍රථම ධර්ම සංගායනාවේ ප්‍රතිඵලයක් ලෙස සූත්‍ර පිටකය නිකාය වශයෙන් කොටස් පහකට බෙදා එය ආරක්ෂා කරගැනීමේ වගකීම භානක භික්ෂූන් වහන්සේලාට පැවරුණි. ඒ අනුව සංයුක්ත නිකාය භාර වූයේ,

(1) ආනන්ද තෙරුන් ඇතුළු ශිෂ්‍ය පිරිසටය.
(2) උපාලි තෙරුන් ඇතුළු ශිෂ්‍ය පිරිසටය.
(3) සැරියුත් තෙරුන්ගේ ශිෂ්‍ය පිරිසටය.
(4) අනුරුද්ධ තෙරුන් ඇතුළු ශිෂ්‍ය පිරිසටය.
(5) මහා කාශ්‍යප තෙරුන්ගේ ශිෂ්‍ය පිරිසටය.

35. පහත දැක්වෙන වරණ අතුරෙන් එකක් තෙවන සංගායනාවට අදාළය. එම වරණය කුමක්ද?

(1) විශාලා මහනුවර, වාළුකාරාමය, සබ්බකාමී මහරහතන් වහන්සේ , කාලාශෝක රජු.
(2) .විශාලා මහනුවර, අශෝකාරාමය, සබ්බකාමී මහරහතන් වහන්සේ , කාලාශෝක රජු.
(3) .පැළලුප්නුවර, අශෝකාරාමය, මොග්ගලී පුත්තතිස්ස හිමි, අශෝක රජු
(4) .රජගහ නුවර, සප්තපර්ණි ගුහාව, මහාකාශ්‍යප මහරහතන් වහන්සේ, අජාසත් රජතුමා.
(5) පැළලුප්නුවර, අශෝකාරාමය, මොග්ගලී පුත්තතිස්ස හිමි, කාලාශෝක රජු

36. පහත සඳහන් වනුයේ කණිෂ්ක අධිරාජයා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි.

A.වසුමිත්‍ර හිමියන්ගේ ප්‍රධානත්වයෙන් සිව්වන ධර්ම සංගායනාව පවත්වන ලදී.
B.පුරුෂ පුරය කණිෂ්ක අධිරාජයාගේ රාජධානිය විය.
C.කණිෂ්ක අධිරාජයා වසර හතළිස් අටක් රාජ්‍ය විචාරණ ලදී.
D මධ්‍ය ආසියාවේ ධර්ම ප්‍රචාරක සේවාවක් ආරම්භ කිරීම.
E කණිෂ්ක අධිරාජයා නැළියක පමණ ධාතු තැන්පත්කොට විශාල ස්තූපයක් ගොඩනැංවීම.

ඉහත ප්‍රකාශන අතරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A සහ B පමණි.
(2) B සහ C පමණි.
(3) B සහ D පමණි.
(4) A, C,D පමණි.
(5) C, D,E පමණි

37. නාලන්දා විශ්ව විද්‍යාලයේ පැවැති අධ්‍යාපන ක්‍රියාවලිය හා පරිපාලන ක්‍රියාවලිය ඉතාමත් සැලසුම් සහගත ව සිදුවූවක් බව ඒ පිළිබඳ ව අධ්‍යයනය කිරීමෙන් හෙළිවේ. මෙම විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන ක්‍රියාවලිය සම්බන්ධව වඩාත් නිවැරදි ප්‍රකාශය ඇතුළත් වරණය වන්නේ,

(1) ද්විතික අධ්‍යාපනය ලැබීමට ඇතුළත් සිසුන් අඛණ්ඩ ව වසර පහළොවක් මෙහි අධ්‍යාපනය ලැබිය යුතු විය.
(2) ඉගැන්වීමේ ක්‍රම ශිල්ප වශයෙන් දේශන, සාකච්ඡා හා විවාද යන ක්‍රම භාවිත වේ.
(3) පාලි හා සංස්කෘත භාෂාවන් සෑම ශිෂ්‍යයෙක් ම අනිවාර්යයෙන් ම හැදෑරිය යුතු විය.
(4) පශ්චාත් උපාධි පිරිනැමුණේ මෙම විශ්ව විද්‍යාලයේ ම අධ්‍යාපනය හැදෑරූ ශිෂ්‍යයන්ට පමණි.
(5) නේවාසික පහසුකම් සැපයීමට, සේවකයින් හා ගම්වර පාලනයට රාජ්‍ය මැදිහත්වීමක් දක්නට ලැබුණි

38. පණ්ඩුකාභය රජතුමා විවිධ ආගමිකයින් සඳහා විවිධ අනුග්‍රහයන් දක්වා ඇත. ඒ අනුව සොත්ථිශාලා නම් ශාලා විශේෂයක් මෙතුමා කිසියම් ආගමික පිරිසකට කර දුන් බව මහාවංශයේ සඳහන් වේ. ඒවා කර දී ඇත්තේ,

(1) බ්‍රාහ්මණ ආගමික පිරිස් සඳහා ය.
(2) ජෛන ආගමික පිරිස් සඳහා ය.
(3) ආජීවක ආගමික පිරිස් සඳහා ය.
(4) පරිබ්‍රාජක ආගමික පිරිස් සඳහා ය.
(5) ශිව ආගමික පිරිස් සඳහය.

39. ලක්දිවට ථෙරවාදී බුදු දහම ලැබීමත් සමඟ ලාංකීය ජන සමාජයට නිශ්චිත දහමක් ලැබුණි. මේ දහම නිකලැල්ව දීර්ඝ කාලයක් පවත්වාගෙන ඒමට මහා විහාරික භික්ෂූන් වහන්සේලාට හැකිවිය. නමුත් කල්ගත වීමේදී එම පිරිසිදු දහමට අභියෝගාත්මක ව යම් යම් මතවාද ඇතුළත් වීමේ අවස්ථාවන් එළඹුණි. වෛතුල්‍යවාදය එසේ ඇති වූ මත වාදයකි. මෙරටට පළමු වරට වෛතුල්‍යවාදය පැමිණෙන්නේ කිනම් රජු දවසද?

(1) ගෝඨාභය රජු දවස ය.
(2) . වෝහාරිකතිස්ස රජු දවස ය.
(3) . භාතිකාභය රජු දවස ය.
(4) මහසෙන් රජු දවස ය.
(5) වළගම්බා රජු දවස ය.

Scanned with CamScanner

40 ඉපැරණි ශ්‍රී ලංකාවේ ආරාම කේන්ද්‍රීය අධ්‍යාපන මධ්‍යස්ථාන ලෙස ප්‍රකට අෂ්ටමූලායතනවලින් සමහර මූලායතන මහාවිහාරයට අනුබද්ධ ව පැවැති අතර ඇතැම් ඒවා අභයගිරියට අනුබද්ධව පැවැතුණි. පහත දක්වෙන්නේ එම මූලායතනවලින් කිහිපයකි.

A ගලතුරු මූල B. කපාරමූල C. උත්තර මූල D. විල්ගම්මූල E. වහදූමූල

මේවායින් අභයගිරියට අයත් මූලායතන වන්නේ

(1) A, C හා D ය. (2) B, C හා E ය. (3) A, C හා E ය. (4) B, C හා D ය.
(5) C, D හා E ය.

41. ථායිලන්තයේ ථෙරවාදී බුදු සමයේ අභිවෘධිය සඳහා රාජ්‍ය මැදිහත්වීම ද තීරණාත්මක සාධකයක් බවට පත්ව ඇත. ඒ අනුව රාජ්‍ය මැදිහත්වීම පිළිබිඹු කෙරෙන අවස්ථා ගණනාවක් පහත සඳහන් වර්ණයන්හි දැකිය හැකිය. එම වරණයන් අතර සාවද්‍ය කරුණක් ඇති වර්ණය තෝරන්න.

(1) බෞද්ධ විහාරාරාම පාලනය කිරීම රාජ්‍ය පාලනයට යටත්වේ.
(2) විහාරස්ථානයන්හි ආගමික කටයුතු සඳහා අවශ්‍ය වියදම් රජය විසින් දරනු ලැබේ.
(3) තාවකාලික පැවිද්ද සිදුකරන අවස්ථාවන්හි එහි මුලසුන හොබවන්නේ රටේ රජු විසිනි
(4) රජයේ ප්‍රධානියා බෞද්ධයෙකු විය යුතුය.
(5) බුදු දහම නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම රාජ්‍යයේ යුතුකමකි.

42. චීනයට බුදුදහම ලැබෙන විට එරට ස්වදේශිකව ගොඩනැගුණ ආගම කිහිපයක් දක්නට ලැබුණි. එම ආගම් අතුරින් එකක් වන්නේ,

(1) තා- ඕ දහම (2) . ෂින්තෝ දහම. (3) නාත් දහම (4) අරි දහම (5) සෙන් දහම

43. ජපානයේ නරා යුගයේ බෞද්ධ සම්ප්‍රදායන් හයක් බුදුදහමට එකතුවිය.

A. කුසා B. ජොජිත්සු C. රිත්සු D හොස්සො E සන්රොන් F කෙංගොන්

යනුවෙන් දැක්වෙන්නේ එම හයයි. මේවායින් විනය, යෝගාචාර, මාධ්‍යමික සම්ප්‍රදායට අදාල නිකායන් ඇතුලත් වනුයේ

(1) A B C වලය. 2) B C D වලය. (3) B D E වලය (4) A, C,D වලය. . (5) C, D,E වලය.

44. බුරුම සංස්කෘතිය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය කුමක් ද?,

(1) නිදහස් දේශය යන නමින් විරුදාවලියට පත්වීම
(2) අනුරුද්ධ රජතුමාගේ මැදිහත් වීමෙන් ත්‍රිපිටකය බුරුම බසට පරිවර්තනය කිරීම
(3) ආසියාවේ වෙනත් කිසි දු කාන්තාවකට නොමැති තරමේ නිදහසක් බුරුම කාන්තාවට හිමිවීම
(4) කුලභේදය නොසලකන එක ම ථෙරවාදී රාජ්‍ය බවට විරුදාවලියට ලක්වීම
(5) බුරුමයේ ස්තූප පැගෝඩා නමින් හැඳින්වේ

45. මහා පරිනිබ්බාන සූත්‍රයෙහි ස්තූප ගොඩ නැගිය යුතු උතුමන් හතර දෙනෙක් පිළිබඳ ව තොරතුරු වාර්තා වේ. එම හතර දෙනාට අයත් නොවන්නේ කවුරුන් ද?

(1) සක්විති රජ (2) බුදුරජාණන් වහන්සේ (3) පසේ බුදුරජාණන් වහන්සේ
(4) බෝසත් උතුමන් (5) මහරහතන් වහන්සේ

46. පහත දක්වෙනුයේ ශ්‍රී ලාංකේය කලා නිර්මාණ පිළිබඳ ව විවිධ අදහස් ඉදිරිපත් කළ විද්වතුන් කිහිප දෙනෙකි.

A. ආචාර්ය සෙනරත් පරණවිතාන B. ආචාර්ය සිරිගුණසිංහ C. මහාචාර්ය විනිවිතාරණ

D. නන්දදේව විජේසේකර E. ඩී. ටී. දේවේන්ද්‍ර

මේ අය අතරින් බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය මුලින් ම ශ්‍රී ලාංකේය නිර්මාණ ශිල්පීන් අතින් සිදුවූ බවට අදහස් ඉදිරිපත් කරන උගතුන් අතරට ගැනෙනුයේ,

(1) A, B, හා C ය. (2) B, C, හා D ය. (3) B, D හා E ය. (4) A, C හා D ය
(5) C, D හා E ය.

Scanned with
CamScanner

47. මහනුවර යුගයේ සිතුවම් .................................................. යුක්ත වේ.

(1) බුද්ධිගෝචර බවින් (2) අක්ෂිගෝචර බවින් . (3) පර්යාවලෝකනයෙන්
(4) පරිමානුකූල බවින් (5) තාත්වික බවින්

48. තිස්ස විද්‍යාලයේ බෞද්ධ ශිෂ්ටාචාරය විෂය උගන්වන රණවීර ගුරුතුමා තම සිසු සිසුවියන් සමග අනුරාධපුර ඉපැරණි අභයගිරි විහාරභූමියේ ඇති සුවිශේෂි නිර්මාණ පෙන්වීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවක නිරතවිය. ඔහු රත්නප්‍රාසදය නම් ගොඩනැගිල්ල සමීපයේ ඇති සුවිශේෂී කලා නිර්මාණය පිළිබඳ ව කදිම විවරණයක් කරන ලදි. එම කලා නිර්මාණය කුමක් විය හැකිද?

(1) කොරවක්ගල නම් වූ කලා නිර්මාණයයි. (2) සඳකඩපහණ නම් වූ කලා නිර්මාණයයි.
(3) වාහල්කඩ නම් වූ කලා නිර්මාණයයි. (4) බෝධිසරය නම් වූ කලා නිර්මාණයයි.
(5) මුරගල නම් වූ කලා නිර්මාණයයි.

49. ලාංකේය බෞද්ධ ගීත සාහිත්‍යය පෝෂණය කළ ගේය පද රචකයන් බුද්ධ චරිතය, බුදුදහම මෙන් ම ශාසන ඉතිහාසය ද වස්තුවිෂය බවට පත්කරගත් අවස්ථා දැකිය හැකි ය. ඒ අනුව පුද්ගලයාගේ සසර ගමන ඇතිකරවන පුද්ගල සිත් තුළ නිමක් නැතුව පවතින අසත් ධර්මයක් පිළිබඳ ව විවරණය කෙරෙන ගීතයකට උදාහරණයක් වන්නේ

(1) ලෝකය පෙරළෙයි .........
(2) කවාලා විලඳජාතී .........
(3) සන්නාලියනේ සන්නාලියනේ .........
(4) සොරදෙටුවෙක් කස තැලුම කකා .........
(5) අඩුකුලේ කියාලා අසරණයා .........

50. මෙරට පද්‍ය සාහිත්‍යයේ ස්වර්ණමය යුගය ලෙස සැලකෙන කෝට්ටේ යුගයේ දී පද්‍ය කෘති ගණනාවක් බිහිවිය. එම ඇතැම් පද්‍ය සාහිත්‍ය සඳහා නිර්මාණකරුවන් වස්තු විෂය බවට පත්කරගෙන ඇත්තේ ජාතක කතාවන්ය. ඒ අනුව සත්තු භත්ත ජාතකය පදනම් කරගෙන නිර්මාණය වූ සාහිත්‍ය ග්‍රන්ථය වනුයේ

(1) කව්සිළුමින (2) බුදුගුණ අලංකාරය (3) ලෝවැඩ සඟරාව
(4) සඳකිඳුරු දා කව (5) කාව්‍යශේඛරය

* * *

Scanned with CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2024**
**Third Term Test - Grade 13 - 2024**

# බෞද්ධ ශිෂ්ටාචාරය - II

කාලය පැය 03 යි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10

නම/ විභාග අංකය:

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කරගැනීමටත් යොදවන්න.

**උපදෙස් -**

- I කොටසින් ප්‍රශ්න දෙකක් ද II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකයට ම ලකුණු 20 බැගින් හිමි වේ.

## I කොටස

1. (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් ආපද් ධර්ම හතරක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii) බ්‍රාහ්මණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ තුනක් පෙන්වා දෙන්න. (ලකුණු 3යි)

(iii) නිගණ්ඨ හා ජටිල ශ්‍රමණ කුල දෙක පිළිබඳ ව හැඳින්වීමක් කරන්න. (ලකුණු 4යි)

(iv) බුද්ධ කාලීන භාරතය නාගරීකරණයට ලක්ව පැවැති බව නිදසුන් හතරක් ඇසුරෙන් ගෙනහැර දක්වන්න. (ලකුණු 5යි)

(v) අජිත කේසකම්බලී ශාස්තෘවරයාගේ ඉගැන්වීම් බුදු දහමින් විචාරයට ලක්වන අයුරු විස්තර කරන්න. (ලකුණු 6යි)

2. (i) බුදුරජාණන් වහන්සේ ලෝකවිදූ නාමයෙන් හැඳින්වීමට හේතු වූ සාධක **දෙකක්** නම් කරන්න. (ලකුණු 2යි)

(ii) බුදුරජාණන් වහන්සේගේ මහා කාරුණිකත්වය නිදසුන් තුනක් මගින් පැහැදිලි කරන්න (ලකුණු 3යි)

(iii ආදර්ශවත් නායකත්වය බුද්ධ චරිතයෙන් පිළිබිඹු කෙරෙන අවස්ථා හතරක් පෙන්වා දෙන්න (ලකුණු 4යි)

(iv) අනේපිඬු සිටුතුමාගේ චරිතයෙන් ගත හැකි ආදර්ශ සැකවින් ඉදිරිපත් කරන්න (ලකුණු 5යි)

(V) බුදුරජාණන් වහන්සේ හා කෝසල රාජ්‍ය අතර පැවැති සබඳතා තහවුරු කෙරෙන සාධක ගෙනහැර දක්වන්න. (ලකුණු 6යි)

3. (i) "නපරේසං විලෝමානි*" යන ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2යි)

(ii) එම ගාථාවේ අර්ථය නිවැරදි ව ලියන්න. (ලකුණු 3යි)

(iii) මිත්‍ර කුල පුත්‍ර සබඳතාවට අදාළ යුතුකම් හා වගකීම් සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 4යි)

(iv) මත්ද්‍රව්‍ය භාවිතයේ ආදීනව සූත්‍රානුසාරයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 5යි)

(V) ධන සම්පත් පරිහානියට බලපාන කරුණු හඳුනා ගැනීමෙන් ආර්ථික දියුණුව උදාකරගත හැකි අයුරු පරාභව සූත්‍රාගත කරුණු හයක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 6යි)

Scanned with CamScanner

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

## II කොටස

4. (i) දැහැමි පාලනයක් උදාකර ගැනීමෙහි ලා දස රාජ ධර්මවල පවත්නා ප්‍රායෝගික වැදගත්කම ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10යි)

(ii) යහපත් සමාජයක් නිර්මාණය කරගැනීමෙහි ලා දස කුසල් උපකාරීවන අයුරු පෙන්වා දෙන්න (ලකුණු 10යි)

5. (i) පුද්ගල දිළිඳුකම ජයගතහැකි සමාජ ප්‍රශ්නයක් බව බෞද්ධ ඉගැන්වීම ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

(ii) හොඳ නරක විනිශ්චය කිරීමෙහි ලා භාවිත බෞද්ධ නිර්ණායකවල වැදගත්කම විමසීමට ලක්කරන්න. (ලකුණු 10යි)

6. (i) දෙවන ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු පෙන්වා දෙමින් එහි ප්‍රතිඵල ශාසන චිරස්ථිතියට හේතු වූ අයුරු ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10යි)

(ii) ධර්මාශෝක අධිරාජ්‍යයාගේ ශාසනික මෙහෙවර නිදසුන් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

7. (i) මහා විහාරයේ ආගමික හා සාමාජික මෙහෙවර ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10යි)

(ii) ජපන් සංස්කෘතිය පෝෂණය කිරීමට බුදු දහමින් ලැබුණු දායකත්වය පරීක්ෂා කරන්න. (ලකුණු 10යි)

8. (i).බෞද්ධ සාරධර්ම සමාජගත කිරීමට ලාංකේය චිත්‍ර කලාව ප්‍රබල මාධ්‍යයක් වී ඇති අයුරු විවරණය කරන්න. (ලකුණු 10යි)

(ii). පහත සඳහන් මාතෘකා දෙකකට ප්‍රමාණවත් කෙටි සටහන් ලියන්න. (ලකුණු 10යි)

(1). අල්පේච්ඡතාව

(2). ලෝක පාලන ධර්ම

(3). බෝධිඝරය

(4). වාහල්කඩ

(ලකුණු 05x2 = 10 යි)

* * *

PAST PAPERS WIKI



Scanned with CamScanner

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!


PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න